# මාසික වෙළඳ විචරණිකාව

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව


ශ්‍රී ලංකා මහ බැංකුව

2022 ජූලි


04 වෙළුම 07 නිකුතුව

## විශේෂ සිදුවීම්

### මාසික අපනයන ක්‍රියාකාරිත්වය





### මාසික ආනයන ක්‍රියාකාරිත්වය





2022 වසරේ ජූලි මාසය තුළ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 1,164ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 5.4කින් ඉහළ ගියේය.

2022 වසරේ ජූලි මාසය තුළ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 1,287ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 24.8කින් පහළ ගියේය.

### අපනයන හා ආනයන වර්ධන අනුපාත (%)




### වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)





2022 වසරේ ජූලි මාසයෙන් අවසාන වන මාස හත තුළ දී අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 12.9කින් ඉහළ ගිය අතර, ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 3.5කින් සුළු වශයෙන් පහළ ගියේය.

2021 වසරේ ජූලි මාසය තුළ දී වෙළඳ ගිණුමේ ශේෂය, 2021 වසරේ ජූලි මාසයේ පැවති එ.ජ.ඩොලර් මිලියන 606ක හිඟයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 123ක හිඟයක් වාර්තා කළේය.


## ප්‍රධාන අපනයන හා ආනයන කාණ්ඩ - (2022 ජන.- ජූලි)

### අපනයන (එ.ජ. ඩොලර් මිලියන) / ආනයන (එ.ජ. ඩොලර් මිලියන)




# අපනයන ක්‍රියාකාරිත්වය

### අපනයන ක්‍රියාකාරිත්වය - (ජන.- ජූලි)




### අපනයන පරිමා හා මිල දර්ශක (ජන.- ජූලි)





2022 වසරේ ජූලි මාසයෙන් අවසාන වන මාස හත තුළ දී, ප්‍රධාන වශයෙන් කාර්මික අපනයන ඉහළ යෑම හේතුවෙන් අපනයන ආදායම ඉහළ ගියේය. එසේ වුවත්, කෘෂිකාර්මික සහ ඛනිජමය අපනයන පහළ යෑමක් වාර්තා කළේය.


2022 වසරේ ජූලි මාසයෙන් අවසාන වන මාස හත තුළ දී, අපනයන පරිමා දර්ශකය සහ අපනයන මිල දර්ශකය, පිළිවෙළින්, සියයට 8.8කින් සහ සියයට 3.7කින් ඉහළ ගියේය.

## කෘෂිකාර්මික අපනයන


### කෘෂිකාර්මික අපනයන ආදායම





### කෘෂිකාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන.- ජූලි)




### තේ සහ රබර් මිල ගණන් *





*2022 ජූලි මාසයේ දී රබර් (දුම් ගැසූ දාර රබර්) සඳහා වෙන්දේසියේ දී මිල ගණන් නියම වී නොමැත


2022 වසරේ ජූලි මාසයෙන් අවසාන වන මාස හත තුළ දී, තේ, කුළුබඩු සහ සකස් නොකළ දුම්කොළ අපනයන ආදායම පහළ යෑමත් සමඟ කෘෂිකාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පහළ ගියේය. කෙසේ වුවත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී, සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත, මුහුදු ආහාර, පොල් සහ රබර් ඉහළ අපනයන ආදායම් වාර්තා කළේය.

## කාර්මික අපනයන


### කාර්මික අපනයන ආදායම





### කාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන.- ජූලි)





### නැව් හා ගුවන් යානා ඉන්ධනවල අපනයන මිල ගණන්





2022 වසරේ ජූලි මාසයෙන් අවසාන වන මාස හත තුළ දී කාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගිය අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන්, රෙදිපිළි හා ඇඟලුම්, ඛනිජතෙල් නිෂ්පාදිත, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, සහ යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ අපනයන ආදායම ඉහළ යෑම හේතු විය. කෙසේ වුවත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී රබර් නිෂ්පාදිත සහ ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත අපනයන ආදායම පහළ ගියේය.

## ආනයන ක්‍රියාකාරිත්වය

### ආනයන ක්‍රියාකාරිත්වය - (ජන.- ජූලි)




### ආනයන පරිමා හා මිල දර්ශකය (ජන. - ජූලි)





අන්තර් භාණ්ඩ ආනයන වියදම් ඉහළ ගියද, මූලික වශයෙන්, ආයෝජන සහ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහළ යෑම හේතුවෙන් 2022 වසරේ ජූලි මාසයෙන් අවසාන වන මාස හත තුළ දී, වෙළඳ භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පහළ ගියේය. මේ අතර, මෙම කාලපරිච්ඡේදය තුළ දී, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ආනයන පරිමා දර්ශකය සියයට 17.7කින් පහළ ගිය අතර, ආනයන මිල දර්ශකය සියයට 17.3කින් ඉහළ ගියේය.

## පාරිභෝගික භාණ්ඩ ආනයන


පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම





පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




පාරිභෝගික භාණ්ඩ ආනයනවල ක්‍රියාකාරිත්වය
(ජන. - ජූලි)





සීනි, පරිප්පු සහ කිරිපිටි සඳහා වූ ආනයන මිල ගණන් වල සාමාන්‍ය





ප්‍රධාන වශයෙන්, විදුලි සංදේශ උපකරණ, බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත සහ ගෘහ උපකරණ ඇතුළු ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහළ යෑම හේතුවෙන්, 2022 වසරේ ජූලි මාසයෙන් අවසාන මාස හත තුළ දී, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම සැලකිය යුතු ලෙස පහළ ගියේය. තවද, ආහාර හා පාන වර්ග කාණ්ඩය යටතේ වර්ග කරන සීනි හා රසකැවිලි, තෙල් හා මේද වර්ග සහ එළවළු (පරිප්පු, ළූණු, අර්තාපල් වැනි දෑ ඇතුළුව) ආනයන වියදමෙහි පහළ යෑම් දක්නට ලැබුණි. කෙසේ වුවත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත, රෙදිපිළි හා උපාංග සහ පාන වර්ග සඳහා වන ආනයන වියදම් ඉහළ අගයක පැවතිණි.

## අන්තර් භාණ්ඩ ආනයන


අන්තර් භාණ්ඩ ආනයන වියදම





අන්තර් භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක



**අන්තර් භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන.- ජූලි)**




**බොර තෙල් හා පොහොර ආනයන මිල ගණන් (මාසික සාමාන්‍ය අගයන්)**





*2021 වසරේ මාර්තු, ජූනි,සැප්තැම්බර්, නොවැම්බර් මාසවල සහ 2022 වසරේ මාර්තු, අප්‍රේල්, ජූනි සහ ජූලි මාසවල බොරතෙල් ආනයනය කර නැත.


ප්‍රධාන වශයෙන්, ඉන්ධන, රෙදිපිළි හා රෙදිපිළි උපාංග සහ දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන්, 2022 වසරේ ජූලි මාසයෙන් අවසාන වන මාස හත තුළ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගියේය. කෙසේ වුවත්, 2022 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළ මූල ලෝහ, තිරිඟු, රසායනික නිෂ්පාදිත, සහ ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත ආනයන වියදම පහළ ගියේය.

## ආයෝජන භාණ්ඩ ආනයන


**ආයෝජන භාණ්ඩ ආනයන වියදම**




**ආයෝජන භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක**




**ආයෝජන භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන.- ජූලි)**




යන්ත්‍රසූත්‍ර හා උපකරණ, ප්‍රවාහන උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ඇතුළු ප්‍රධාන ආයෝජන භාණ්ඩ කාණ්ඩ තුනෙහිම ආනයන වියදම පහළ යෑම හේතුවෙන්, 2022 වසරේ ජූලි මාසයෙන් අවසාන වන මාස හත තුළ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම පහළ ගියේය.

# විදේශීය වෙළඳාම - සාරාංශය (අ)

## අපනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| | | ජූලි- 2021 | ජූලි- 2022 | වෙනස (%) | ජන. - ජූලි 2021 | ජන.- ජූලි 2022 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | | **267.1** | **228.3** | **-14.5** | **1,526.0** | **1,454.3** | **-4.7** |
| එයින් | තේ | 115.1 | 117.5 | 2.1 | 765.7 | 694.9 | -9.2 |
| | පොල් | 40.6 | 33.1 | -18.6 | 236.9 | 248.9 | 5.1 |
| | කුළුබඩු | 45.8 | 33.8 | -26.2 | 242.7 | 193.4 | -20.3 |
| | මුහුදු ආහාර | 40.5 | 20.6 | -49.0 | 146.9 | 162.8 | 10.9 |
| **කාර්මික අපනයන** | | **829.1** | **932.2** | **12.4** | **5,236.9** | **6,192.5** | **18.2** |
| එයින් | රෙදිපිළි හා ඇඟලුම් | 454.1 | 551.4 | 21.4 | 2,941.5 | 3,528.7 | 20.0 |
| | රබර් නිෂ්පාදිත | 93.4 | 86.4 | -7.5 | 593.1 | 579.7 | -2.3 |
| | ඛනිජතෙල් නිෂ්පාදිත | 52.0 | 32.2 | -37.9 | 248.6 | 377.6 | 51.9 |
| | ආහාර, පාන වර්ග හා දුම්කොළ | 48.5 | 49.7 | 2.4 | 296.5 | 324.1 | 9.3 |
| | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 45.8 | 52.4 | 14.4 | 288.0 | 322.9 | 12.1 |
| | මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 24.6 | 43.1 | 75.4 | 156.7 | 235.4 | 50.2 |
| | සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 5.4 | 8.2 | 51.7 | 28.0 | 45.5 | 62.8 |
| **ඛනිජ හා වෙනත් අපනයන** | | **7.7** | **3.1** | **-59.9** | **40.1** | **31.0** | **-22.7** |
| **මුළු අපනයන** | | **1,103.9** | **1,163.6** | **5.4** | **6,803.0** | **7,677.8** | **12.9** |

## ආනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | | ජූලි- 2021 | ජූලි- 2022 | වෙනස (%) | ජන. - ජූලි 2021 | ජන.- ජූලි 2022 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | | **342.7** | **184.3** | **-46.2** | **2,255.0** | **1,714.4** | **-24.0** |
| ආහාර හා පාන වර්ග | | 117.9 | 109.7 | -7.0 | 1,032.8 | 966.6 | -6.4 |
| එයින් | එළවළු (ආ) | 31.5 | 24.2 | -23.0 | 242.6 | 193.3 | -20.3 |
| | සහල් | 1.1 | 24.8 | 2,244.1 | 8.0 | 195.6 | 2,333.6 |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | | 224.8 | 74.6 | -66.8 | 1,222.2 | 747.9 | -38.8 |
| එයින් | පෞද්ගලික රථවාහන | 2.3 | 1.0 | -56.6 | 6.7 | 4.9 | -27.0 |
| **අන්තර් භාණ්ඩ** | | **982.3** | **889.0** | **-9.5** | **6,932.4** | **7,547.5** | **8.9** |
| එයින් | ඉන්ධන | 256.0 | 345.4 | 34.9 | 2,043.2 | 2,929.3 | 43.4 |
| | රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 251.2 | 220.3 | -12.3 | 1,702.3 | 1,905.9 | 12.0 |
| | පොහොර | 5.6 | 32.3 | 479.6 | 103.0 | 78.3 | -24.0 |
| | තිරිඟු හා ඉරිඟු | 26.3 | 4.1 | -84.6 | 210.9 | 140.4 | -33.4 |
| **ආයෝජන භාණ්ඩ හා වෙනත්** | | **385.1** | **213.5** | **-44.6** | **2,537.4** | **2,053.1** | **-19.1** |
| එයින් | යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 232.0 | 145.0 | -37.5 | 1,598.5 | 1,326.3 | -17.0 |
| **මුළු ආනයන** | | **1,710.1** | **1,286.8** | **-24.8** | **11,724.8** | **11,315.0** | **-3.5** |

## වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | ජූලි- 2021 | ජූලි- 2022 | වෙනස (%) | ජන. - ජූලි 2021 | ජන.- ජූලි 2022 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **වෙළඳ ශේෂය** | -606.2 | -123.2 | | -4,921.8 | -3,637.2 | |

## වෙළඳ දර්ශක හා වෙළඳ මිල අනුපාතය (2010 = 100) (ඇ)

| කාණ්ඩය | | ජූලි- 2021 | ජූලි- 2022 | වෙනස (%) | ජන. - ජූලි 2021 | ජන.- ජූලි 2022 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **අපනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 153.6 | 162.0 | 5.4 | 135.3 | 152.7 | 12.9 |
| | පරිමා දර්ශකය | 163.0 | 149.9 | -8.0 | 150.8 | 164.1 | 8.8 |
| | මිල දර්ශකය | 94.3 | 108.0 | 14.6 | 89.7 | 93.0 | 3.7 |
| **ආනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 153.0 | 115.2 | -24.8 | 149.9 | 144.7 | -3.5 |
| | පරිමා දර්ශකය | 152.7 | 97.3 | -36.3 | 162.4 | 133.6 | -17.7 |
| | මිල දර්ශකය | 100.2 | 118.4 | 18.1 | 92.3 | 108.3 | 17.3 |
| **වෙළඳ මිල අනුපාතය** | | 94.0 | 91.2 | -3.0 | 97.2 | 85.9 | -11.6 |

(අ) තාවකාලික
(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.
(ඇ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද